# පුරප්පාඩු සඳහා ඉල්ලුම්පත් කැඳවීම

## ජාතික පොලිස් කොමිෂන් සභාව

ජාතික පොලිස් කොමිෂන් සභාවේ පළාත් අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් - 1) හා පළාත් අධ්‍යක්ෂ (වයඹ පළාත) තනතුරු සඳහා පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති විශ්‍රාමික නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පළාත් අධ්‍යක්ෂ තනතුරු 02**

I. පළාත් අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් - 1) - තනතුරු සංඛ්‍යාව 01

II. පළාත් අධ්‍යක්ෂ (වයඹ පළාත) - තනතුරු සංඛ්‍යාව 01

**02. සලකා බලන සුදුසුකම්**

- රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ හෝ විශේෂ ශ්‍රේණියේ ඕනෑම තනතුරක සේවය කළ විශ්‍රාමික නිලධාරියෙකු විය යුතුය.
- සිංහල භාෂාව හැරුණු විට ඉංග්‍රීසි/ දෙමළ භාෂාව පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වේ.
- විමර්ශන කටයුතු පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වේ.
- පළමුව කොන්ත්‍රාත් පදනම මත වර්ෂයක කාලයක් සඳහා පත් කරනු ලබන අතර පවත්නා වලංගු නීති රීති හා විධිවිධාන වලට අනුව කාර්ය සාධනය මත සේවා දිගු ලබාදීම සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව තීරණය කරනු ලැබේ.
- සියලු දීමනා ඇතුළත්ව මාසිකව රු.70,000/- ක දීමනාවක් ගෙවනු ලැබේ.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 64 නොඉක්මවා තිබිය යුතුය.

**03. අයදුම්පත් යොමු කිරීම** අපේක්ෂිත අයදුම්කරුවන් තම ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පතක් 2026.10.23 වන දිනට පෙර, **තනුජා එන්. ප්‍රනාන්දු, ලේකම්, ජාතික පොලිස් කොමිෂන් සභාව, අංක 09 ගොඩනැගිල්ල, BMICH පරිශ්‍රය, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ තමන් ඉල්ලුම් කරන තනතුර සඳහන් කල යුතුය.

තනුජා එන්. ප්‍රනාන්දු
ලේකම්
ජාතික පොලිස් කොමිෂන් සභාව
අංක 09 ගොඩනැගිල්ල
BMICH පරිශ්‍රය, කොළඹ 07

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED